දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 19 / 2016

බ/12/13/ඇස්තමේන්තු/2017

ගිණුම් අංශය

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09

2016.06.02

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන් වෙත

**සිරකරු සුබ සාධක අරමුදල් ගිණුමේ 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

ඉහත අරමුදල සම්බන්ධයෙන් සෑම ඉදිරි වර්ෂයක් සඳහාම අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර පුනුරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙතින් අනුමත කරවාගත යුතු අතර ඉන්පසු එය මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. එබැවින්, පහත සටහන් වලට අනුව 2017 මුදල් වර්ෂය සඳහා අය වැය ඇස්තමේන්තුව සකස් කර බන්ධනාගාර මූලස්ථානය වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

02. එකී අයවැය ඇස්තමේන්තුවට 2017 වර්ෂය තුලදී සුබ සාධක අරමුදලට බැර වශයෙන් බලාපොරොත්තු වන ලැබීම්ද, හර වශයෙන් බලාපොරොත්තු වන ගෙවීම්ද ඇතුලත් කල යුතු අතර අරමුදලේ ලැබීම් වශයෙන් වර්ෂය තුල ලැබීම් වල සත්‍ය තත්වයට ආසන්න වන අයුරින් ලැබීම් ඇස්තමේන්තුව පිළියෙල කල යුතුය. 2017 වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ඇස්තමේන්තුව (ආකෘතිය - ඒ) මගින් පිළියෙල කල යුතු අතර 2015 ජුනි සිට 2016 වර්ෂයේ මැයි 31 දක්වා මාස 12 (දොළහක) ලැබීම් හා ගෙවීම්වල සත්‍ය තත්වය (ආකෘතිය - බී) මගින් පිළියෙල කර එවිය යුතුය.

03. තවද, මෙම ඇස්තමේන්තුව සැකසීමේදී පවතින සත්‍ය වියදමට වඩා විචලනය 20% ඉක්මවයි නම්, මුළු විචලනය ඇතුලත් වියදම් සඳහා විස්තරාත්මකව වියදම් විස්තර ලබාදිය යුතුය.2015.06.01 වන දින සිට 2016.05.31 අතර කාලය තුල රැස්කළ ආදායමට වඩා 2017 ආදායම් ශීර්ෂ වල ලැබීම් වැඩි වී ඇත්නම් එම ලැබීම් රැස්කරන ආකාරය බන්ධනාගාර අධිකාරී විසින් පෞද්ගලිකව සහතික කර විස්තරාත්මක ලේඛණයන් එකිනෙක ආදායම් ශීර්ෂය සඳහා පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.ඉහත උපදෙස් අනුව නියමිත ආකෘතින්ට සැකසූ 2017 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තුව 2016 ජුනි 25 දින හෝ ඊට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ලැබීමට සැලැස්විය යුතු බව වැඩි දුරටත් දන්වා සිටිමි.

04. යම් උප බන්ධනාගාර ආයතනයක් 2016 ජුනි 25 දිනට පෙර මෙම ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, එම ආයතනයේ වියදම් සමස්ථ ඇස්තමේන්තුවට ඇතුලත් නොකෙරෙනු ඇත. තවද මෙම ගිණුම් පවත්වාගෙන යායුතු ආකාරය පිළිබඳ 1977.11.16 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:56/1977 හා1987.03.20 දිනැති සංශෝධිත දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 559 මගින්ද උපදෙස් ලබාදී ඇත.

05. 2017 වාර්ෂික වියදම් ඇස්තමේන්තුව සකස් කිරීමේදී වියදම් ශීර්ෂ අංක: 01 සිට 06 දක්වා සඳහන් කරනු ලබන ඇස්තමේන්තුගත වියදම්, 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංයුක්ත සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් වලට අනුකූල විය යුතුය. 2017 ඇස්තමේන්තුවට ඇතුලත් වියදම් මත සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්මට හැර අන් කිසිවක් සඳහා ප්‍රතිපාදන හෝ අක් මුදල් නිකුත් කරනු නොලැබේ.

..........................................

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත: 01. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන)
02. බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක)

(ආකෘතිය - ඒ)

# 2017 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුව

## සිරකරු සුබ සාධක අරමුදල

| 2017 මුදල් වර්ෂය තුල අපේක්ෂිත ලැබීම් (ගිණුමට බැර) | | 2017 මුදල් වර්ෂය තුල අපේක්ෂිත ගෙවීම් (ගිණුමට හර) | |
|---|---|---|---|
| ලැබීම් ශීර්ෂය | රු. | ගෙවීම් ශීර්ෂය | රු. |
| 1. විනෝද භාණ්ඩ නිෂ්පාදන ලාභයෙන් 1/6 කොටස | | 1. සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික ශුභ සිද්ධිය සඳහාවූ වියදම්. | |
| 2. සිර වේතන වලින් කරනු ලබන අනිවාර්යය අයකිරීම් | | 2. සිරකරුවන්ගේ අධ්‍යපනික ශුභ සිද්ධිය සඳහා වූ වියදම්. | |
| 3. මහජන පරිත්‍යාග වලින් ලද මුදල් | | 3. සිරකරුවන්ගේ විනෝද ක්‍රිඩා පහසුකම් හා වෙනත් පහසුකම් සඳහා වූ වියදම්. | |
| 4. සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීමෙන් වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද ආදායම්. | | 4. සිරකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා වූ වියදම්. | |
| 5. සිරකරුවන් වෙත තිබී හසුවූ නීති විරෝධී මුදල් ලැබීම් | | 5. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) | |
| 6. බන්ධනාගාර හැම්යේ තිබී සොයාගත් අයිතිකරුවන් නොමැති මුදල් ලැබීම් | | 6. නිදහස්වූ සිරකරුවන්ගේ පුනුරුත්ථාපනයෙහිලා උපකාර් වන පශ්වාත් භාර සේවා වියදම්. | |
| 7. වෙළඳසැල් වලින් ලද මුදල් | | | |
| 8. ප්‍රදර්ශණ වලින් ලද මුදල් | | | |
| 9. ආපන ශාලා වලින් ලද මුදල් | | | |
| 10. විෂය භාර ලේකම් විසින් අනුමත කල වෙනත් දායක මුදල් | | | |
| 11. හිමිකම් පානු නොලැබූ මුදල් | | | |
| 12. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ලැබීම්) | | | |
| වර්ෂය තුල අපේක්ෂිත මුළු ලැබීම් | | වර්ෂය තුල අපේක්ෂිත මුළු ගෙවීම් | |

සකස් කලේ :- ......................................

පරීක්ෂා කලේ :- ................................

ඉහත ඇස්තමේන්තුවේ නිවැරදිතාවය සහතික කරමි.

...........................................................

ස. බන්ධනාගාර අධිකාරි/ බන්ධනාගාර අධිකාරි

නම :

දිනය :

(ආකෘතිය - බී)

# සත්‍ය ලැබීම් හා ගෙවීම්

(2015.06.01- 2016.05.31)

## සිරකරු සුබ සාධක අරමුදල

| 2015/2016 මුදල් වර්ෂය තුල සත්‍ය ලැබීම් (ගිණුමට බැර) | | | 2015/2016 මුදල් වර්ෂය තුල සත්‍ය ගෙවීම් (ගිණුමට හර) | | |
|---|---|---|---|---|---|
| ලැබීම් ශීර්ෂය | 2015.06.01 සිට 2015.12.31 | 2016.01.01 සිට 2016.05.31 | ගෙවීම් ශීර්ෂය | 2015.06.01 සිට 2015.12.31 | 2016.01.01 සිට 2016.05.31 |
| 1. විනෝද භාණ්ඩ නිෂ්පාදන ලාභයෙන් 1/6 කොටස | | | 1. සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික ශුභ සිද්ධිය සදහාවූ වියදම්. | | |
| 2. සිර වේතන වලින් කපනු ලබන අනිවාර්යය අයකිරීම් | | | 2. සිරකරුවන්ගේ අධ්‍යපනික ශුභ සිද්ධිය සදහා වූ වියදම්. | | |
| 3. මහජන පරිත්‍යාග වලින් ලද මුදල් | | | 3. සිරකරුවන්ගේ විනෝද ක්‍රීඩා පහසුකම් හා වෙනත් සැප පහසුකම් සදහා වූ වියදම්. | | |
| 4. සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීමෙන් වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද ආදායම්. | | | 4. සිරකරුවන්ට ත්‍යාග ලබාදීම සදහා වූ වියදම්. | | |
| 5. සිරකරුවන් වෙත තිබී හසුවූ නීති විරෝධී මුදල් ලැබීම් | | | 5. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) | | |
| 6. බන්ධනාගාර භූමියේ තිබී සොයාගත් අයිතිකරුවන් නොමැති මුදල් ලැබීම් | | | 6. නිදහස්වූ සිරකරුවන්ගේ පුණරුත්ථාපනයෙහිලා උපකාර වන පශ්චාත් භාර සේවා වියදම්. | | |
| 7. වෙලඳසැල් වලින් ලද මුදල් | | | | | |
| 8. ප්‍රදර්ශණ වලින් ලද මුදල් | | | | | |
| 9. ආපන ශාලා වලින් ලද මුදල් | | | | | |
| 10. විෂය භාර ලේකම් විසින් අනුමත කල වෙනත් දායක මුදල් | | | | | |
| 11. හිමිකම් පානු නොලැබූ මුදල් | | | | | |
| 12. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ලැබීම්) | | | | | |
| **වර්ෂය තුල මුළු සත්‍ය ලැබීම්** | | | **වර්ෂය තුල මුළු සත්‍ය ගෙවීම්** | | |

සකස් කලේ :- ........................................

පරීක්ෂා කලේ :- ........................................

ඉහත ලැබීම් හා ගෙවීම් වල නිවැරදිතාවය

සහතික කරමි.

............................................................

ස. බන්ධනාගාර අධිකාරි/ බන්ධනාගාර අධිකාරි

නම :

දිනය :